# කර්මාන්ත බදු අය කිරීම.

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ පවත්වාගෙන යන කර්මාන්ත හෝ වෙළෙඳාම් සඳහා එම හිමිකරුවන් විසින් අදාළ පළාත් පාලන ආයතනයට කර්මාන්ත බද්දක් ගෙවිය යුතු ය.

එය කරන්නේ කෙසේ ද?

**01**

පළාත් පාලන ආයතනය විසින් හඳුනා ගෙන ලැයිස්තු ගත කර ඇති බද්දට යටත් කර්මාන්ත හෝ වෙළෙඳාම් පිළිබඳ ලේඛනයේ සඳහන් තැනැත්තන් වෙත කර්මාන්ත බදු නිවේදනය සෑම වසරක ම මාර්තු 31 වන දිනට පෙර විද්‍යුත් පණිවුඩයක් මගින් හෝ අතින් බාර දීම සිදු කෙරේ

**02**

බදු නිවේදනය ලැබී දින හතක් ඇතුළත, බදු මුදල ගෙවා අවසන් කළ යුතු ය

**03**

පහසුකම් සලසා ඇති විට, මාර්ග ගත ක්‍රමයෙන් බද්ද ගෙවිය හැකි අතර, එසේ නොහැකි වන විට, පෙරටු කාර්යාලයට පැමිණ බද්ද ගෙවිය හැකි ය

**04**

බදු මුදල් ගෙවූ පසු ඒ මොහොතේ ම පෙරටු කාර්යාල නිලධාරී විසින් ඒ වෙනුවෙන් ඔබට ලදු පතක් ලබා දේ

## ඔබ බදු නොගෙවන්නේ නම් ?

**05**

නියමිත දින වන විට බදු නොගෙවූ අවස්ථාවක, බද්ද ගෙවීමට යටත් තැනැත්තාට සභාවෙන් සිහි කැඳවීමක් යොමු කරනු ඇත.

**06**

සිහි කැඳවීමෙන් පසුවත් බදු මුදල ගෙවීම පැහැර හරින්නන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කරනු ඇත.

**07**

ඉන් පසු අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දෙන දිනයක ඔබ උසාවියේ පෙනී සිටි යුතු ය

**08**

එදින අය කර ගත යුතු මුදල දඩයක් ලෙස අය කර ගැනීමට මහේස්ත්‍රාත්වරයා විසින් නියෝගයක් නිකුත් කරනු ඇත

**09**

ආදායම් පරීක්ෂකගේ අධීක්ෂණය යටතේ නම් කළ නිලධාරියා වෙත දඩ මුදල් ගෙවිය යුතු අතර ඒ සඳහා ඔබ වෙත ලදුපතක් නිකුත් කරනු ඇත